# පළාත් පාලන මන්ත්‍රී සංසදය

2025.07.13

## රනිල්ගේ තවත් ගේම් එකක් අතේ මාට්ටු

වත්මන් ආණ්ඩුව කෙරෙහි ජනතාව තැබූ විශ්වාසය දිනෙන් දින කඩා වැටීම හමුවේ රටේ මීළඟ නායකත්වය පිළිබඳ යළිත් සමාජය කතා කරන්නට පටන්ගෙන තිබේ.

වත්මන් මාලිමා ආණ්ඩුවේ බහාලුම් සිද්ධිය සමඟ ඇරඹි ජනතා විශ්වාසය කඩවීම කේෂ්ත්‍ර ගණනාවක් ඔස්සේ ව්‍යාප්ත වෙද්දී, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසගේ ක්‍රියාකාරීත්වය ක්‍රම, ක්‍රමයෙන් සමාජය තුළ කතාබහ කරන්නට පටන්ගෙන තිබේ.

ඒ ආණ්ඩුවේ ජනතා විරෝධී කටයුතුවලට සෘජුව විරෝධය දක්වමින් ඇතැම් සිදුවීම් ආපස්සට හැරවීමට පවා, සජිත් ප්‍රේමදාස තීක්ෂණව තම දේශපාලන ක්‍රියාකාරීත්වය මෙහෙයවමින් සිටින පසුබිමකය.

වත්මන් රජය ක්‍රියාත්මක කළ පරාටේ නීතිය අත්හිටුවා දෙන්නටත්, කොතලාවල විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය දේශීය සිසුන්ට හැදෑරීමට අවස්ථාව සලසා දෙන්නටත්, බහාලුම් වංචාව ඇතුළු මාලිමා රජයේ විවිධ අක්‍රමිකතා හෙළිදරව් කිරීමටත් පියවර ගත් සජිත්, ඇමරිකාවේ බදු ප්‍රතිපත්තියට රටක් ලෙස මුහුණදීමට සහය ලබාදීම සහ මෙරට ආර්ථිකය යළි පන ගැන්වීමට උපකාර කරන ලෙස ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගෙන් සෘජුව ඉල්ලා සිටීමත් තුළින් තම රාජ්‍ය තාන්ත්‍රික භාවය සහ විචක්ෂණශීලී දේශපාලන දැක්ම හරහා විපක්ෂ නායකවරයකුගේ සැබෑ භූමිකාව රටටම පෙන්වා දෙමින් සිටී.

එවැනි පසුබිමක සජිත්ගේ මෙම වෘත්තීමය ස්භාවය ඔහුගේ ප්‍රතිවාදීන් යළිත් වියරු වැටීමට හේතුවක් වී ඇති බව පෙනෙන්නට තිබේ.

එහි ආසන්නතම උදාහරණය ලංකාදීප පුවත්පත සමාජ මාධ්‍ය අවකාශය තුළ වාර්තා කර ඇති මේ ප්‍රවෘත්තියයි.

'සජබ මුල්පුටු පෙරලෙයි' යනුවෙන් දක්වා තිබූ ඒ ප්‍රවෘත්තියේ ඉලක්කය වී තිබුනේ, යළිත් සමගි ජන බලවේගය තුළ අභ්‍යන්තර ගැටුමක් ඇති බව සමාජගත කිරීමට බව පැහැදිලිය.

ලංකාදීප යනු රනිල් වික්‍රමසිංහගේ අවශ්‍යතා අනුව ක්‍රියාත්මක වන සිය පවුලේ පුවත්පතක් වන අතර, එහි දේශපාලන ප්‍රවෘත්ති වාර්තාකරණයද පවුලේ අවශ්‍යතා මත සිදුවන බව හොඳින්ම මේ රටේ ජනතාව දන්නා සත්‍ය වේ.

මීට පෙර අවස්ථා ගණනාවකදී සජිත් ප්‍රේමදාස ඉලක්ක කර දේශපාලන ප්‍රවෘත්ති වාර්තා කළ ලංකාදීපය ඉන් තම අරමුණ සාර්ථක කරගැනීමට නොහැකිවූ කළ, මෙම ප්‍රවෘත්තිය හරහා සමගි ජන බලවේගයේ අනෙකුත් නිලතල වෙනස් කිරීමේ අවශ්‍යතාවක් සමාජ ගතකරමින් යළිත් පක්ෂය තුළ බෙදීමක් නිර්මාණය කිරීමට සැරසෙන බව පැහැදිලිය.

ලංකාදීපය එය වාර්තා කර තිබුණේ මේ අයුරිනි.

උපුටා ගැනීම :
මැතිවරණ හයක් එක දිගට පරාජයට පත්ව ඇති හෙයින් ආසන සංවිධායකවරුන් මාරු කිරීමට පෙර පක්ෂය ආරම්භයේ සිට කටයුතු කළ නිලධාරීන් සහ නායකයන් වහාම වෙනස් කරන්නැයි ආසන සංවිධායකවරුන් පිරිසක් සහ පක්ෂයේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරුන් දස දෙනෙකු සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතා පසුගියදා පෞද්ගලිකවම හමුවී දැඩිව ඉල්ලීමක් කර ඇත.

මීට අමතරව මෙම ප්‍රවෘත්තිය හරහා රනිල් වික්‍රමසිංහ මහතා උලුප්පා දැක්වීමට ද ලංකාදීප වාර්තාව උත්සාහ කර තිබුණේ මේ අයුරිනි.

උපුටා ගැනීම :
ගෝඨාභය රාජපක්ෂ මහතා රට භාර දුන් මුල් අවස්ථාවේදී විපක්ෂ නායකවරයා වශයෙන් භාරගත්තේ නම් එසේ කරන වැඩ කොටස තුළින් යම් නමක් හදා ගැනීමට හැකියාව තිබූ බවත්, රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය ජනාධිපතිවරණයේදී ලක්ෂ විස්සක ඡන්ද පදනමකට ගියේ රට බාර ගැනීමෙන් යම් නමක් හදා ගැනීම නිසා බවද සඳහන් කර ඇති.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා අග්‍රාමාත්‍යධූරය භාර ගැනීමට කළ ආරාධනාව සජිත් ප්‍රේමදාස ප්‍රතික්ෂේප කළ බවක් රටට ඒත්තු ගැන්වීමට උත්සාහ දැරුවත් සත්‍යවශයෙන්ම සිදුවූයේ සජිත් ප්‍රේමදාස අග්‍රාමාත්‍යධූරය භාරගැනීම කැමැත්ත පළ කරමින් කොන්දේසි 4 ක් ඇතුලත් කර යැවූ ලිපිය පසෙක තබා, කිසිදු කොන්දේසියක් නොදැමූ රනිල් වික්‍රමසිංහට පස්සා දොරෙන් අග්‍රාමාත්‍යධූරය පිරිනැමීම බව මේ රටේ ජනතාව පැහැදිලිව අවබෝධ කරගත යුතුය.

2022 වසරේ මැයි 12 වනදා සජිත් ප්‍රේමදාස සිය ලිපිය මගින් ඉල්ලා තිබුණේ, ජනතා කැමැත්තට ගරු කරමින් නිශ්චිත කාලසීමාවකදී ජනාධිපතිධූරයෙන් ඉවත්වීම, 19 වන ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීම, 21 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා විධායක ජනාධිපතිධූරය ඉවත් කිරීම සහ ජනජීවිතය යථා තත්ත්වයට පත්කොට කඩිනමින් මහමැතිවරණයක් පැවැත්වීම යන ඉල්ලීම් 4ය.

මෙම සියළු ඉල්ලීම් එදා මේ රටේ පොදු ජනතාව ඉල්ලා සිටි ප්‍රධාන කාරණ බව අප මෙහිදී අවධාරණය කර සිටින්නෙමු.

එසේ හෙයින් මෙවැනි පුවත්, වත්මන් ආණ්ඩුව දිනෙන් දින ජනතා අප්‍රසාදයට පත්වෙද්දී, පාර්ලිමේන්තුවේ එකදු ආසනයක් දිනා ගැනීමට නොහැකිව සමාජය තුළ කොන්වී සිටින රනිල් වික්‍රමසිංහ වැනි කුමන්ත්‍රණකාරී පාලකයින් යළි ඉස්මතුවීමට දරණ නිෂ්ඵල වෑයමක් බව ප්‍රගතිශීලී මාධ්‍ය සංවිධාන එකමුතුව ලෙස අප අවධාරණය කරන්නෙමු.

එමෙන්ම තම පටු දේශපාලන අරමුණු වෙනුවෙන් පෙනී සිටින අවස්ථාවාදී දේශපාලඥයින්ට, විකෘති පුවත් සමාජ ගත කිරීමට ඉඩකඩ සලසා දෙන ලංකාදීප වැනි මාධ්‍ය මුදලාලිකරණය සිදුකරන ආයතනවල මෙම ක්‍රියාකාරීත්වයද අප තරයේ හෙළා දකින බව අවධාරණය කර සිටින්නෙමු.